# ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

**(සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය )**

## ඇබෑර්තු

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් ස්ථිර තනතුරු සඳහා මූලික සුදුසුකම් සපුරා ඇති පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය) තනතුර - 01

**සුදුසුකම් ( පහත සුදුසුකම් 1 හෝ 2)**

1. ගිණුම්කරණය / කළමනාකරණය / වාණිජ්‍යවේදී / ව්‍යාපාර කළමනාකරණය / රාජ්‍ය කළමනාකරණය යන විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක්

   සහ

   උපාධිය ලබාගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

2. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) ආවසරික සහතිකය හෝ මධ්‍ය පරීක්ෂණයෙන් සමත් සහතිකය / (CIMA/ACCA) හි වෘත්තීය I මට්ටමෙන් සමත් සහතිකය හෝ ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා සහතිකය සමඟ අදාළ සුදුසුකම් ලබාගැනීමෙන් පසු ගිණුම්කරණ / විගණන ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 01 ක පළපුරුද්ද.

**අතිරේක සුදුසුකම්**

1. ඉංග්‍රීසි භාෂාවෙන් වැඩකිරීමේ හැකියාව
2. පරිගණක භාවිතය පිළිබඳ දැනුම හා ඒ පිළිබඳ වෘත්තීය අධ්‍යාපන සුදුසුකම් තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්** (පහත සඳහන් 1 හෝ 2 සපුරා තිබිය යුතුයි.)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. "කණිෂ්ඨ ඣ ´ ù $කාර" (JM) සේවා ගණයේ අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස් සීමාව -** අවුරුදු 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

වැටුප් ක්‍රමය - 2016.04.25 දිනැති 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව 2020 සිට තනතුරට හිමි වැටුප් පරිමාණය MM 1-1 2016 රු. 53,175 - 10x1375 - 15x1910 - 95,575 වේ.
බඳවා ගැනීමේ දී වැටුප් තලය රු.42,161.00 හා රජයේ අනුමත වෙනත් දීමනා ගෙවනු ලැබේ.

**පහසුකම් හා වෙනත් දීමනා -**

දුරකථන පහසුකම් - මාසික කාර්යාලීය දුරකථනය, ජංගම දුරකථනය හා නිවස සඳහා රු.5,000.00 ක මුදලක් ද හිමි වේ.
රජය මඟින් අනුමත දීමනා ද හිමිවේ

## අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර - 01

**සුදුසුකම්**

වාණිජ්‍ය / ගිණුම්කරණය යන විෂය ක්ෂේත්‍රයන්ගෙන් ලබාගත් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධිය.

**වයස් සීමාව -** අවුරුදු 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

වැටුප් ක්‍රමය - 2016.04.25 දිනැති 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව 2020 සිට තනතුරට හිමි වැටුප් පරිමාණය MA 3 - 2016 රු. 32,200 - 10x445 - 11x660 - 10x730 - 5x750 - 54,960 වේ.
බඳවා ගැනීමේ දී වැටුප් තලය රු. 25,560.00 හා රජයේ අනුමත වෙනත් දීමනා ගෙවනු ලැබේ.

වෙනත් දීමනා - රජය මඟින් අනුමත දීමනා හිමිවේ.

**පොදු කොන්දේසි**

සෑම ඉල්ලුම්කරුවකුම

- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම හෝ ඉන් දෙකකින් වැඩ කිරීමේ හැකියාව තිබිය යුතුය. පරිගණක භාවිතය පිළිබඳ දැනුම හා ඒ පිළිබඳ වෘත්තීය අධ්‍යාපන සුදුසුකම් ලබා තිබිය යුතුය.

මෙම තනතුර ස්ථිරය.සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තියින්ගේ භාරකාර අරමුදලට දායකය විය යුතුය. වසර තුනක පරිවාස කාලයකින් පසු සේවය ස්ථිර කරනු ලැබේ. මූලික සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් අතරින් තෝරාගත් පිරිසක් සම්මුඛ පරීක්ෂණයට කැඳවන අතර, එහිදී ලබා ගන්නා ලකුණු තත්ත්වය අනුව තනතුරට තෝරා ගනු ලැබේ. තමන් පිළිබඳ විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනකුගේ නම් හා ලිපිනයන්ද සහිතව සකස් කරනු ලැබූ අයදුම්පත් **2018.04.25** දිනට පෙර "සභාපති, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය, අංක **18**, රාජගිරිය පාර, රාජගිරිය " යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ ප්‍රධාන කාර්යාලයේ පාලන අංශය වෙත ගෙනවිත් බාරදීම කළයුතුය. දැනටමත් රාජ්‍ය අංශයේ හෝ ව්‍යවස්ථාපිත අයතනවල සේවය කරන අයදුම්කරුවන් ආයතන ප්‍රධානියා මඟින් අයදුම්කළ යුතුය. අයදුම්පත එවන ලිපි කවරයේ වම් ඉහළ කෙළවරෙහි අයදුම්කරනු ලබන තනතුර සඳහන් කර තිබිය යුතුය.

කීර්ති සුරංජිත් මාවැල්ලගේ
සභාපති
ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
"සමාජ ආරක්ෂණ පියස
අංක **18**, රාජගිරිය පාර, රාජගිරිය.

## ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

**.................................................... තනතුර සඳහා අයදුම්පත්‍රය**

*කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා* [ ]

01. (i) සම්පූර්ණ නම : ..........................................................................................
..........................................................................................
(ii) මුලකුරු සමඟ නම : ..........................................................................................

02. (i) ස්ථිර ලිපිනය : ..........................................................................................
..........................................................................................
(i) තාවකාලික ලිපිනය : ..........................................................................................
..........................................................................................

03. දුරකථන අංකය (පෞද්ගලික) : ............................................ (ජංගම) : ............................................

04. උපන්දිනය : ........................................ 05 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : ..............................

06. ස්ත්‍රී / පුරුෂ භාවය : ...................................... 07 විවාහක / අවිවාහකබව : ...................................

08. ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................................

09. අධ්‍යාපනික සුදුසුකම් (අදාළ පිටපත් අමුණන්න) : ..........................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................

10. වෘත්තීය සුදුසුකම් (අදාළ පිටපත් අමුණන්න) : ..........................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................

11. දැනට රැකියාව කරන ස්ථානය සහ තනතුර : ..........................................................................
..........................................................................................

12. ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම සහ ලිපිනය:

| | |
|---|---|
| (1) නම : ........................................ | (1) නම : ........................................ |
| ........................................ | ........................................ |
| ලිපිනය : ........................................ | ලිපිනය : ........................................ |
| ........................................ | ........................................ |
| ........................................ | ........................................ |

මම විසින් සපයන ලද ඉහත කරුණු මාගේ දැනීමේ හැටියට නිවැරදි හා සත්‍ය බව මෙයින් සහතික කරමි.

දිනය : ...............................................  ........................................................
අයදුම්කරුගේ අත්සන

**දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතුය.**

**(රාජ්‍ය සේවයේ / සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වූවන් සඳහා පමණක් අදාළ වේ)**

..........................................................................................මයා / මිය / මෙනෙවිය
ඉහත සඳහන් තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු / ඇය සේවයෙන් නිදහස් කළ හැක / නොහැක.

දිනය :...............................................  ........................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

(නිල මුද්‍රාව සහිතව)

Source: www.ssb.gov.lk (2018.04.19)